ගෙදර ගෙන ගිය අපි ගම්පහ වික්‍රමාරච්චි වෙද රාළහාමි ළඟට ද ගියෙමු. දොස්තරලා කී දේ ම වෙද රාළහාමි පැවසුවේ ශ්ලෝකයක් ද කියමිනි.

කවුරුන් කෙසේ කීවත් අපි බලාපොරොත්තු අත් නොහළෙමු. වාද්දුවේ කපුවකුගේ හාස්කම් ගැන ඇසූ අපි ඇය එහාට ගෙන ගියෙමු. සුමානෙන් ඇවිද්දවනවා, යනුවෙනි ඔහු අපට කීවේ. ඒ යන විට නංගීට ඇවිදින්නට බැරි තරමට අමාරුය. සුමාන දෙකක් ගිය විටත් තව ටිකක් බැලුවෙමු. වැඩක් නැත. ඊළඟට මහර, රාගම, කව්ඩාන, කළුබෝවිල හාස්කම් කරන ගැහැනු-මිනිස්සු, ඒ තැන්වලට රොක් වූවන්ගේ අත්දැකීම් එතැනදී දුටු පුදුම සුව කිරීම් ගැන අසන අපි ඊළඟ හාස්කම අපේ නංගී සුවවී දුව පැන ඇවිදීම බව තදින් ම විශ්වාස කළෙමු. මේ අතර බෙහෙත් හේත් කිරීම ද නිමක් නැත. අපේ අසල්වාසීහු දිවා රෑ නොබලා අපට බෙහෙත් සොයා දුන්හ. අප සමඟ යන යන තැන ගියහ.

අන්තිම මාස තුන හතර අප සිටියේ පුදුම මානසික රාමුවක සිර වී බව අපිම නොදත්තෙමු. එක් අතකින් අද හෙටම නොපැතූ-නොසිතූ විදියේ හාස්කමකින් අපේ නංගී සුවපත් වන සැටි සිතින් මවා ගත්තෙමු. අනේ අතින් ළඟ ළඟ ම එන මහා ව්‍යාසනයක පෙර නිමිති දැක තැති ගත්තවුන් මෙන් සිතට රිංගා ගත් මහා භීතියකින් නිරන්තරයෙන් පීඩාවට පත් ව සිටියෙමු. ආනන්දයේ නේවාසිකාගාරයේ සිටි මගේ සගයෝ පවා මගේ මේ තැති ගත් ස්වභාවය තේරුම් ගත්හ. මා ගැන සෙවිල්ලෙන් සිටියහ.

නංගී මිය ගිය දිනට කලින් දා පාන්දර පහට ගෙදරින් පිටත් ව මම කළුබෝවිල නිවසක සාත්තර කියන අම්මණ්ඩි කෙනකු වෙත ගියෙමි. මඩ ගොහෙරුවක බිව වාඩි වී ඇයට සවන් දුන්නෙමි. රෝගියා සුව කිරීම ගැන නඇයට සැකයක් නැත. ඇගේ සැනසුම් වදන් කණට වැටෙන විට ඒවා සැබෑ බව පිලිගන්නැයි මගේ සිතට මම ආයාචනා කරමි. එහෙත් මගේ සිත මට එන මඟ කණ වැකුණ හඬක් සිහිපත් කරයි. තල්ගහවිල හන්දියට කිට්ටුව පයින් එන මගේ කන් පසාකර ගෙන ගියේ කොහේදේ කැලෑ රොදක සිට තඟයට හූ කියන නරින්ගේ ගෝරනාඩුවයි. බයිසිකලයක සීනු හඬ ඇසුණ විට පවා තැති ගන්නා තැනට පත් වී සිටි මට අන්තිමට ඒ සීනු හඬ ඇසුණේ විදුලි පුවත ගෙනා පණිවුඩකරුගෙනි. නංගීට අමාරුයි. පුවත එය වුවද ඇත්ත කුමක්දැයි මම දැන ගතිමි. පාසැලේ වැඩ ඇති හෙයින් මා ආවේ උදේ පාන්දරින් ගෙදරින් පිටත් වෙලාය. දැන් පනිත්ය හමාර වී කාමරයට ආවා විතරය.

නංගී අසනීපයෙන් සිටි මාස හත අට තුළ එක රැයක් හරියට නින්දක් නොලත් අම්මා ඉන් පසු එතරම් සනීපයකින් පසු නොවූවා ය. වයසට යත් ම එම දැඩි වෙහෙස ඇගේ සෞඛ්‍යය කෙරෙහි තදින් ම බලපෑවේ ය. මල්ලිගේ අධ්‍යාපනය ද එම කරදර නොවන්නට තව ටිකක් දුරට කරගෙන යන්නට තිබුණි. ඒ කිසි දෙයක් ගැන කිසි කෙනෙක් කපසු නොතැවුණහ. අපට දරා ගත නොහැකි වූයේ අප මෙතරම් අගය කළ වස්තුවක් අහිමිවීමය. නංගී සුව කර ගැනීමට අප දැරූ තැත ගැන අසල්වාසීන් තුළ පැවැති විස්මය වචනයට නඟන්නට එඩිතර වූයේ මගේ හිතවතෙකි.

''අපි කටක් ඇරල කොහොමද කියන්නේ ? තමුසෙලා පුදුම මිනිස්සුනේ. මේ දරුව සනීප කරගන්න තමුසෙලා අන්තිම වෙනකල් දුව පැනපු හැටි පුදුම වෙලා අපි බලා සිටියා.''

නංගීගේ ආදාහනය ද හොඳින් ම කරන්නට අපට අපගේ අසල්වාසීහු, හිතවත්තු උදව් කළහ. දුරබැහැරින් පවා අපේ මිතුරෝ පැමිණ අපගේ ශෝකය අප සමඟ බෙදා හදා ගත්හ. එබඳු අවස්ථාවක කිසිසේත් බලාපොරොත්තු නෙවූ හිතවතකු, මිතුරකු තකහනියක් අප නිවසට එනු දැක්ම සිතට පුදුමාකාර සැනසිල්ලකි. නංගීගේ ආදාහනයට පැමිණි ගමේ උදවිය, අසල්වැසියන් ගැන එදා ඇතිවූ පැහැදීම, ණයගැතිබව, පහසුවෙන් අමතක නොවන්නකි. මෙන්න මේ අතීත අවස්ථාව වෙතය, නායක හාමුදුරුවන් ඉදිරියේ කරුණු කියන්නට ඉදිරිපත්ව සිටි මගේ සිත දිව ගියේ. මගේ සිත එක එල්ලයක රැඳෙන්නට නායක හාමුදුරුවන් මට මුහුණ දී ගෙනම කී දෙයක් බලපෑවේ ය

''ඕනෑ කරදරයකට මුනිදාස ඉදිරිපත් වෙනවා කියලත් කියන්න කිව්වා.''

හරි, ඒ ගැන සැලකිල්ල යොමු කළ යුතු ය. මුනිදාස ආදාහනයට පැමිණියේ ය, ආදාහනයට ම නොවේ. ආදාහනය නිම කොට අප ආපසු ගෙදර පැමිණි පසු ගෙදරට ගොඩ වයේ ය. සෙනඟ අස්සේ එන්නට බැරි නිසා විය යුතුය. මුනිදාස මගේ සහෝදරයා යොදා ගන්නට යන්නේ එඩ්මන්ඩ් අමරසේකරට එරෙහිවය. මෙතෙක් නිතරඟයෙන් ගමෙන් තේරුණු ඔහු සමඟ තරඟ කොට පරදන්නට ය මල්ලී ඉදිරිපත් කරන්නේ.

එඩ්මන්ඩ් අමරසේකර නොහොත් පුංචි මහත්තයා ඒ වන විටත් ගම්සභාපති ය. නංගී ආදාහනය කළේ අපේම ඉඩමක ය. පවුලේ සුසාන භූමිය නමින් අප විසින් හඳුන්වන ලද ඒ ස්ථානයේ තවත් අය ආදාහනය කොට ඇත. එහෙත් සුසාන භූමියට නොගොස් අපේම ඉඩමක කරන ආදාහනයට ගම්සභාවෙන් අවසර ගත යුතුය. ගියේ කවුදැයි මතක නැත. ළඟම කෙනකු විය යුතුය. ඔහු පුංචි මහත්තයා හමුවන්නට ගියේ ආදාහනය දවස් දෙකක් තියා ය. අවශ්‍ය නිල කටයුතු අතර ම පුංචි මහත්තයා ඒ ගිය පුද්ගලයාට දුන් පණිවුඩය ද මගේ දෙසවණ දෝංකාර දෙන්නට විය.

''අනේ ඒ ගොල්ලන්ට කියන්න මට ආදාහනේට එන්න ලැබෙන්නේ නැහැ කියලා. මම අවශ්‍ය වැඩකට කොලඹ යන්න යොදානෙ තියෙනවා එදාට.''

අපි ආදාහනය දා පුංචි මහත්තයා බලාපොරොත්තු නොවුනෙමු. ඒ අතරම පුංචි මහත්තයා වෙතට අපේ කෙනකු යන්නට කලින් ම මුනිදාස මුණ ගැසුණු අසල්වැසියෙක් ආදාහනය ගැන ඔහුට කීවේය. ඒබ ව මට කීවේ ඒ පුද්ගලයාමය. අප අපේක්ෂා නොකළ එඩ්මන්ඩ් අමරසේකර පුංචි මහත්තා ආදාහනය දා පැමිණියේ අමුත්තන් බොහෝ දෙනකු එන්නට කලින් ය. ආවා පමණක් නොවේ පැය ගණනක් ම එහි සිටියේ ය. එසේ සිටීමේ වැදගත්කම තවත් වැඩි ව න්නට කරුණක් විය. අපේ ශිෂ්‍ය නිවාස පාළක සමඟ පැමිණි ගුරු පිරිසේ නායකත්වය දැරුවේ විදුහල්පති එස්.ඒ. විජයතිලක මහතාය. මරණ ගෙදර පැයක් හමාරක් වාඩිවී උඩ බලාගෙන සිටින්නට විජයතිලක මහතාට සිදුවූයේ නැත. පරණ ගෝලයෙක් එහි පැමිණ සිටියේ ය. නාලන්දා විද්‍යාලයේදී තමන්ගේ ගෝලයකු ව සිටි එඩ්මන්ඩ් අමරසේකර සමඟ ආ ගිය තොරතුරු කතා කළ ඔහුට පාළුවක් දැනෙන්නට නැත. මුනිදාස පාළු මරණ ගෙදර එන විට ඒ කිසිවෙක් එතැන නැත.

මෙහෙවූ බලවතා ද අපට හදිස්සියකට පිහිට වන්නට එන්නේ ? ඔහුගේ වුවමනාවට අපේ මල්ලී තරඟ කරන්නේ අර වගේ මනුස්සයකුට එරෙහිව ද ?

ඉහත කී සිද්ධියේ හරුබස්ස පමණක් මම නායක හාමුදරුවන්ගේ සිතට කාවදින අයුරින් ඉදිරිපත් කළෙමි. උන්වහන්සේ ආපසු පන්සලට වඩින්නට රියට ගොඩ වූයේ කතා නැතුවය. මුනිදාස මිල්ලෑවට තරඟ නොකල බව මා දැන ගත්තේ පසුව ය. මල්ලී සාගර පලන්සූරියගේ මැතිවරණ රැස්වීම්වල පවා කතා කළ විත්තිය දැන ගත්තේ පසුව ය. ඒ ගැන කිසිවක් ඔහුගෙන් අසන්නට නොගියෙමි. ගම්සභා ඡන්දය ගැන අප දෙදෙනා අතර වචනයක් හුවමාරු වූයේ ද නැත. මල්ලීට පසු බසින්නට සිදු වවද, පුංචි මහත්තයාට නිතරඟයෙන් එන්නට නොහැකි විය. කිදෙල්පිටියේ ගම්පතිව සිටි ගුණතිලක රාළහාමිගේ සහෝදරයා ඔහුට එරෙහිව තරඟ වැදුණේ ය. ඔහු මිල්ලෑවේ උප තැපැල් ස්ථානයේ අධිපතිව සිටියේ ය. තැපැල් මහත්තයා යනුවෙන් ගම්මන් හැඳින්වූයේ ඒ නිසා ය.

තැපැල් මහත්තයා අහිංසක පුද්ගලයෙකි. ඔහු තරඟ කරන බව ආරංචි වූ විට පරණ පුරුද්දට වාගේ මගේ සිත යළිත් වරක පරණ කතන්දර අවුස්සන්නට විය. මේ වන විට මම රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සේවයට ගොස් සිටියෙමි. ලොකු නංගී විවාහ වූයේ චූටි නංගීගේ ආදාහනයට අවුරුද්දකට හමාරකට පසුවය. තාත්තා ගමේ සෑහෙන පිරිසකට මඟුල් කෑම ආරාධනා කර තිබුණේ ය. පුංචි මහත්තයා රෑ බෝ වී පයින් ම වෙල ඔස්සේ මඟුල් කන්නට ආ සිටි මට මතක් විය. මෙහෙම වෙලාවට අමතක කළ යුතු දේත් මතක් වන හැටි පුදුම ය. පුංචි මහත්තයා එන විට ගෙදර සිටියාක් මෙන් ම තැපෑලෙන් ආ තෑගි මුදල් සහිත ලියුම විවෘත කරන විට ද මම එතැන සිටියෙමි. තැපැල් මහත්තයාගේ ලියුම විවෘත කළේ ද මම ය. රුපියල් දකේ තැපැල් ඇණවුම තාත්තා අතට දුන්නේ ද මමය. තැපැල් කන්තෝරුවේ සිටි තැනින් නොසෙල්වීම තැපැල් ඇණවුමක් කවරයේ දැමීම කොයි තරම් අපහසු කාරියක් ද ? සැතැපුමක් හමාරක් පයින් බයිසිකලයෙන් යනවාට වඩා අමාරු වැඩකි.

කිසිවකුගෙන් නො විමසා කිසිවකුට නො දන්වා ගමට ගිහින් ඡන්දය දමන්නට මම තීරණය කළෙමි. කෙටි නිවාඩුව පැය එක හමාරයි. ගමනට පැය හතරක්වත් ගතවෙයි. හෙමින් හෙමින් ම මුල්ලපිටියේ ලඟට ගියෙමි.

''රාළහාමි මම ටිකක් එළියට ගිහිල්ලා එන්නම්''

රාළහාමි හිස වනා එකඟතාව පළ කළේ ය. ඔහුට කියා කන්තෝරුවෙන් පිට වුහොත් කොමසාරිස් තුමා තබා සක්කරයා ආවත් මා බේරා ගන්නට ඔහුට හැකි බව අත්දැකීමෙන් දක සිටියෙමි. රීඩ් මාවතෙන් පාදුක්ක බසයකට නැග ගත් මම පාදුක්කෙන් බැස කුලී කාරෙයකින් කිදෙල්ලපිටියට ගොස් ඡන්දය දමා ගිය පයින් ම ආපසු කන්තෝරුවට ආවෙමි. ඡන්ද පොළේ සිටි දෙපැත්තේ ම අයට හිස නමා සිනහවක් පෑ නමුත් කතා කරන්නට නැවතුණේ නැත. ගෙදර ගියේත් නැත. කිසිවකු සමඟ ඒ බව කීවේ ද නැත. එහෙත් පුංචි මහත්තයා මා කළ දෙය දැනගත් බව පසුව ආරංචි විය. අදත් ඒ ගැන පසුතැවීමක් මගේ හිතේ නැත.

දිවංගත ඞී.බී.කුරුප්පු